# <u>ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්) තනතුරු සඳහා විවෘත පදනම යටතේ බඳවා ගැනීම - 2025</u>

**01.** ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්) III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු 15 ක ප්‍රමාණයක් විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් සහිත ඌව පළාතේ ස්ථිර පදිංචි පහත දැක්වෙන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ 2025.11.07 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**02. බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :-**

2.1 අයදුම්කරු /අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

2.2 විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

2.3 ඌව පළාතේ අවම වශයෙන් අවුරුදු තුනක (03) ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

2.4 යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

2.4 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-**

3.1 මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු හෝ වැන්දඹු පුරුෂ හෝ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.

3.2 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි විධි විධාන ප්‍රකාරව නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

3.3 බඳවා ගන්නා නිලධාරීන් ඌව පළාත තුළ කවර හෝ ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

3.4 තෝරා ගනු ලබන්නන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආයතන සංග්‍රහයටද, ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයටද, ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්ය සංග්‍රහයට හා මුදල් රීති සංග්‍රහයටද, මුදල් රෙගුලාසිවලටද, රජයේ සහ පළාත් සභා රාජ්‍ය සේවයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස්වලට හා ඒවාට අදාළ වරින් වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද යටත් විය යුතුය.

**04. වැටුප් පරිමාණය :**

4.1 කාර්මික නිලධාරී(සිවිල්) – III ශ්‍රේණිය සඳහා, රා.ප.ච. 10/2025 හි MN 3 - 2025 අනුව, රු. 52,250 - 10 x 800- 11 x 1190 -10 x 1320 - 10 x1350 – 100,040/- ක වැටුප් පරිමාණය හිමි වන අතර, උක්ත චක්‍රලේඛයේ උපලේඛන III අනුව 2027.01.01 දින දක්වා වැටුප් ගෙවනු ලැබේ.

**05. එක් එක් තනතුරට අදාළ වයස් සීමාව, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ තරග විභාගයේ විෂය නිර්දේශය:**

| අනු අංකය | තනතුර, බඳවා ගන්නා ශ්‍රේණිය හා වයස් සීමාව | අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් | තරඟ විභාගයේ විෂය නිර්දේශය |
|---|---|---|---|
| 01 | කාර්මික නිලධාරී (සිවිල්)<br><br>III ශ්‍රේණිය<br><br>වයස :<br>අවු.18 නොඅඩු සහ අවු.30 ට නොවැඩි විය යුතුය. | **අධ්‍යාපන සුදුසුකම්**<br><br>සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය/ විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.<br>සහ<br>ක්ෂේත්‍රයට අදාළ විෂයන් දෙකක් සහිතව විද්‍යා/ ගණිත/ තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයන් තුනකින් (03) අ.පො.ස (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම.<br>(අදාල විෂයන් ඇමුණුම 1 මගින් දක්වා ඇත.) | **1. බුද්ධි පරීක්ෂණය - පැය 01 - ලකුණු 100**<br><br>අපේක්ෂකයාගේ භාෂාමය කුසලතාවය, සංඛ්‍යාමය හැකියාව, තර්කානුකූල ශක්තිය, විශ්ලේෂණ සංස්ලේෂණ හැකියාව, ඉක්මනින් නිවැරදි තීරණ ගැනීමේ හැකියාව ආදිය මැනීම සඳහා සකස් කළ බහුවරණ හා ව්‍යුහගත රචනා ප්‍රශ්න ඇතුලත් ප්‍රශ්න පත්‍රයකි.<br><br>**2. සාමාන්‍ය දැනීම - පැය 03 - ලකුණු 100**<br><br>ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ආර්ථික දේශපාලන සමාජ තොරතුරු ඇතුලත් ප්‍රශ්න පත්‍රයකි. |

| | | | |
|---|---|---|---|
| | | **වෘත්තිය සුදුසුකම්**<br><br>I. මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT)<br>හෝ<br>II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (NDES)<br>හෝ<br>III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (HNDE)<br>හෝ<br>IV. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව<br>හෝ<br>V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කර තිබීම<br>හෝ<br>VI. රැකියා ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය කුසලතා NVQ 06 මට්ටමට සමාන සුදුසුකම් ලබා තිබීම<br>හෝ<br>VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණික සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. | (විභාගය සමත්වීම සඳහා එක් එක් විෂයට 40% ලකුණු ලබා ගත යුතුය.) |

**06. බඳවා ගැනීමේ ක්‍රමය :-**

6.1 පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි ව්‍ධිමත් අයදුම්පත් සංඛ්‍යාවක් ඉදිරිපත් කර ඇති විට ලිඛිත තරඟ විභාගයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු විධිමත් අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇත්නම් තරග විභාගයක් නොපවත්වන අතර, සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තොරා ගනු ලැබේ.

6.2 තරඟ විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු අදාළ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ.

6.3 තරඟ විභාගය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග ඒකකය මගින් පවත්වනු ලැබේ. තරඟ විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අපේක්ෂකයෙකු මුළු විභාගය සඳහාම පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

6.4 විභාගයෙන් සමත්වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට ලබාගත යුතු අවම ලකුණු සංඛ්‍යාව 40% කි.
විභාග දිනයේදී අපේක්ෂකයාගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ වලංගු ජාතික හැඳුනුම්පත, වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ලියවිලි හැර වෙනත් කිසිදු ලියවිල්ලක් පිළිගනු නොලැබේ.

**07. අයදුම්පත් ඉදිරිපත් කිරීම :-**

7.1 මෙම විභාග සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයින්, **https://exams.psc.up.gov.lk/** වෙබ් සබැඳිය ඔස්සේ මාර්ගගත අයදුම් කිරීමේ ප්‍රවේශය වෙත පිවිස **2025.11.07** දින ප.ව 11.59 ට හෝ ඊට පෙර විභාගය සඳහා මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කළ යුතු අතර, එම අයදුම්පත සම්පූර්ණ කර පද්ධතියට යොමු කළ (Submit) පසුව අයදුම්පතේ මෘදු පිටපත බාගත (මෙනුවෙහි Application වෙත පිවිසෙන්න) කර ගත යුතුය. බාගත කර ගන්නා ලද අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගෙන විභාගය සඳහා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය ද නියමිත ස්ථානයේ අලවා අත්සන සහතික කර, **2025.11.14** දින හෝ ඊට පෙර "**ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පීළිපොතගම පාර, පිංඅරාව, බදුල්ල**" යන ලිපිනයට ලියාපදිංචි

තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"ඌව පළාත් සහා රාජ්‍ය සේවයේ කාර්මික නිලධාරී (සිවිල්) තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීම - 2025"** යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

7.2 දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ හෝ මධ්‍යම රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

7.3 එසේම, මාර්ගගත පද්ධතිය ඔස්සේ ඇතුළත් කරනු ලබන කිසිදු තොරතුරක් පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එබැවින් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit)කිරීමට පෙර එම තොරතුරු හොඳින් පරීක්ෂා කිරීම වැදගත් වනු ඇත. විධිමත්ව සම්පූර්ණ නොකරන ලද හා අසම්පූර්ණ තොරතුරු සහිත හෝ වැරදි තොරතුරු සහිත සියලු අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයේ හා මුදල් ගෙවා ලබා ගන්නා ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම අයදුම්කරුවන්ට ප්‍රයෝජනවත් වනු ඇත.

**සටහන - මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2025.10.27 දින පෙ.ව 9.00 ට විවෘත වන අතර, 2025 නොවැම්බර් මස වන 07 දින ප.ව 11.59 ට අවසන් වේ.**

## 08. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

**8.1 පළාත් රාජ්‍ය සේවයේ / මධ්‍යම රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම :-**

අයදුම්පතෙහි ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්කරුවෙකු තම අත්සන තම ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

**8.2 රාජ්‍ය සේවයේ නොසිටින අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම :-**

අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු / කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයකු / සාමදාන විනිශ්චයකාරවරයකු / දිවුරුම් කොමසාරිස්වරයකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු / පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු / රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

## 09. විභාග හා පරිපාලන ගාස්තු :-

**විභාග ගාස්තු හා පරිපාලන වියදම් රු.1250/- කි.** මෙම මුදල ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20.03.02.13 ට බැර වන පරිදි ඌව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලද ලදුපතේ මුල් පිටපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතේ මුල්පිටපත අයදුම්පත්‍රයට අමුණා එවීම අනිවාර්ය වන අතර, ඉදිරි ප්‍රයෝජනය සඳහා එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වැදගත් වේ. ඌව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් හෝ මුද්දර හෝ භාරගනු නොලබන අතර, එම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

## 10. විභාග පටිපාටිය හා තරග විභාගයේ විෂයය නිර්දේශය

10.1 බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2025.11.07 දිනට මෙම නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති, පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි විධිමත් අයදුම්පත් සංඛ්‍යාවක් ඉදිරිපත් වී ඇත්නම් පමණක් එකී අයදුම්කරුවන් සහතික පත්‍ර පරීක්ෂා කිරීමකින් තොරව විවෘත තරඟ විභාගයට ඉදිරිපත් කරනු ලැබේ.

10.2 විභාගය පැවැත්වීමට අවම වශයෙන් දෙසතියකට පෙර ප්‍රවේශ පත්‍ර ඊමේල් (Email) මගින් එවනු ලබන අතර, විභාගය සඳහා අයදුම් කිරීමේ දී විද්‍යුත් තැපැල් ලිපිනය (Email Address) නිවැරදිව සඳහන් කළ යුතුය. විභාග දිනට සතියකට පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ පිළිබඳව ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අයදුම්පත්‍රයේ සහතික කළ ඡායා පිටපතක්, මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ පිටපතක් ද, ප්‍රවේශ පත්‍රය එවීම සඳහා වට්සැප් (WhatsApp) අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීමක් කළ යුතු වේ. මීට අමතරව https://exams.psc.up.gov.lk/admission/ සබැඳිය මගින් ද විභාග ප්‍රවේශ පත්‍රය බාගත කර ගැනීමට පහසුකම් සලසනු ඇත. ඒ අනුව වෙබ් අඩවියෙන් ප්‍රවේශ පත්‍රය භාගත කර ගෙන පරික්ෂා කර බලා සංශෝධන වෙතොත් අදාළ තීරුවෙහි සංශෝධනය විය යුතු ආකාරය නිවැරදිව සඳහන් කර අයදුම්කරුගේ අත්සන යෙදිය යුතුවේ. තරඟ විභාගය සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට වූ පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10.3 තරඟ විභාගය බදුල්ල හා මොණරාගල නගරවලදී පැවැත්වීමට අපේක්ෂා කෙරේ. අයදුම්කරුවන් සංඛ්‍යාව අනුව විභාගය පැවැත්විය යුතු නගර පිළිබඳ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරනු ඇත.

10.4 නියමිත විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10.5 විභාග දිනයේ දී අපේක්ෂකයාගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත, වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ලියවිලි හැර වෙනත් කිසිදු ලියවිල්ලක් පිළිගනු නොලැබේ.

10.6 තරඟ විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පතක් නිකුත් කිරීම, අයදුම්කරු අදාළ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයදුම්කරු පත්වීම් ලබා දීම සඳහා නුසුදුස්සෙකු ලෙස සලකනු ලැබේ.

10.7 මෙම තරඟ විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අපේක්ෂකයෙකු මුළු විභාගය සඳහාම පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**11. සාවද්‍ය තොරතුරු සැපයීම :-**

මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුව ද අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ යම් තොරතුරක් සාවද්‍ය බව හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

**12.** මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම / නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාවෙන් කොටසක් සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව හෝ මේ සම්බන්ධයෙන් වන කුමන හෝ කරුණක් පිළිබඳ අවසාන තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම / තීරණය කිරීම ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ උපදෙස් මත ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදු කරනු ඇත.

13. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

14. මේ පිළිබඳ වැඩි විස්තර කාර්යාල වේලාව තුළ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දූරකථන අංක 0552222400, 0552231460 ඇමතීමෙන් ලබා ගත හැකිය.

(එච්.එම්.ජීවන්ත හේරත්)
ලේකම් (වැ.බ)
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2025.10.25වන දින,
බදුල්ල
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.